# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1826/38 - 2013 සැප්තැම්බර් මස 06 වැනි සිකුරාදා - 2013.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/11/6/2007. *නඩු අංකය* : A/3236

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2007.10.19 දිනැති හා අංක 1519/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2007.10.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 03, 22 වන පටුමග, අංක 03 හි පිහිටි කොළඹ වෙළඳ කාර්මික සහ පොදු කම්කරු සංගමය (CMU) හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ, තැ. පෙ. 141 හී පිහිටි සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ 15, ශ්‍රීමත් රාමනාදන් මාවත, අංක 256, සෙට්මිල් මෙරිටයිම් සෙන්ටර්, 2 වන මහල හි පිහිටි ඉන්ටර් ඕරියන්ට් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.07.19 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 අගෝස්තු මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : අයි.ආර්./11/06/2007

කාර්මික අධිකරණයේදීය

කොළඹ වෙළඳ කර්මික සහ
පොදු කම්කරු සංගමය (CMU)
අංක 03, 22 වන පටුමග,
කොළඹ 03.

පැමිණිලිකාර පාර්ශවය

01. සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
තැ.පෙ. 141, කොළඹ.

02. ඉන්ටර් ඕරියන්ට් ලොජිස්ටික්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
2 වන මහල, සෙට්මිල් මෙරිටයිම්
සෙන්ටර්,
අංක 256, ශ්‍රීමත් රාමනාදන් මාවත,
කොළඹ 15.

වගඋත්තරකාර පාර්ශවය

ප්‍රදානය

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය ආතාවුද සෙනෙවිරත්න මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග' කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය, 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කම්කරු ආරාවුල් පණතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2007.10.17 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ :-

"සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එහි කොන්ත්‍රාත්කරු වන ඉන්ටර් ඕරියන්ට් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් මගින් සිය සමාගමේ සේවයේ යොදවා සිටි මෙයට අමුණා ඇති උප ලේඛනයෙහි නම් සඳහන් ප්‍රයිම්මූවර් රියැදුරන් පනස් පස්



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

දෙනාට (55) 2006.05.03 වෙන දින සිට වැඩ ලබා නොදීම යුක්තිසහගතද යන්න හා යුක්තිසහගත නොවන්නේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳවද වේ."

පෙනී සිටීම:

මෙම නඩුවේ ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් නියෝජිත ඊ. වී. එන්. කබ්රාල් මහතා පෙනී සිටි අතර, වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටීම පහත සඳහන් පරිදි වේ :-

පළමුවන වගඋත්තරකාර සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙනුවෙන් නීතිඥ කපිල දිසානායක මහතා සහ මානව සම්පත් කළමනාකාර සී. එච්. ලියනගේ මහතා පෙනී සිටි අතර, දෙවන වගඋත්තරකාර ඉන්ටර් ඔරියන්ට් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙනුවෙන් නීතිඥ මංජු සිදම්බරම් මහත්මිය සහ නීතිඥ භූෂාන් ඉල්ලේපෙරුම මහතා සමග ජනාධිපති නීතිඥ ජෙෆ්රි අලගරත්නම් පෙනී සිටි අතර, එම ආයතනයේ නියෝජිත වශයෙන් (අධ්‍යක්ෂ) පණ්ඩුක වීරසේකර මහතා නියෝජනය කළේය.

පාර්ශවයන්ගේ ප්‍රකාශ සහ පිළිතුරු ප්‍රකාශ මා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු වගඋත්තරකාර පාර්ශවය විසින් නගන ලද මූලික විරෝධයක් සම්බන්ධයෙන් 2008.06.27 වෙනි දින මූලික නියෝගයක් ප්‍රකාශයට පත් කරන ලදුව වගඋත්තරකාර පාර්ශවය එම මූලික විරෝධයට එරෙහිව අභියාචනා අධිකරණයට රිට් ආඥාවක් ඉල්ලා පෙත්සමක් ඉදිරිපත් කරන ලදී. (අංක CA 674/08)

මෙම රිට් ආඥාව විභාග කළ අභියාචනා අධිකරණය ප්‍රධාන ප්‍රශ්නයට විසඳුමක් ගැන විභාග කිරීමට පෙර මෙම සේවකයින්ගේ සේවා යෝජකයා කවරෙක්ද යන්න පරීක්ෂා කර බලා නිගමනයක් කිරීමට මට උපදෙස් දෙන ලදී.

අභියාචනයේ උපදෙස් අනුගමනය කරමින් සේවා යෝජකයා කවරෙක්ද යන්න ගැන මා විමර්ශනය කරමින් සිටියදී මෙම නඩුව දෙපාර්ශවයේ එකඟත්වයෙන් බේරුම් කර ගැනීමේ අවශ්‍යතාවය පාර්ශවයන්ට දැන්වීමෙන් පසු මෙම යෝජනාවට එකඟත්වය පල කර වගඋත්තරකාර පාර්ශවය මේ පිළිබඳ දෙවන වගඋත්තරකාර පාර්ශ්වය වන ඉන්ටර් ඔරියන්ට් ලොජිස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කොට තීරණයකට එළඹීම සඳහා මගෙන් දිනයක් ලබා ගන්නා ලදී. මේ සම්බන්ධයෙන් බේරුම්කරණ ඉදිරියට පැමිණ දෙවන වගඋත්තරකාර පාර්ශවයේ අධ්‍යක්ෂ පණ්ඩුක වීරසේකර මහතා උනන්දුවෙන් ක්‍රියා කළේය.

2013.07.05 වෙනි දින දෙපාර්ශවය මෙම ආරවුල සාමකාමීව බේරුම් කර ගැනීමට දෙවන වගඋත්තරකාර පාර්ශවයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බැව් බේරුම්කරණයට දැනුම් දෙන ලදී. ඉල්ලුම්කාර පාර්ශවයද ඊට එකඟත්වය පළ කළේය.

ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් වෙළඳ සහ පොදු කම්කරු සංගමය (CMU) වෙනුවෙන් ඊ.වී.එන්. කබ්රාල් මහතාද දෙවන වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් අධ්‍යක්ෂ පණ්ඩුක වීරසේකර මහතාද අත්සන් කර සමාගමේ මුද්‍රාව සහ අත්සන මෙම ගිවිසුම පූර්ණ හා අවසන් සමථයක් බැව් තහවුරු කර ඇත. පළමුවන වගඋත්තරකාර සමාගම වන සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් මෙම සමථයට අදාළ නොවන බැවින් එම සමාගම නඩුවෙන් නිදහස් කරන ලදී. අවසානයේදී පාරිතෝෂිත දීමනා සහ වෙනත් දීමනා සේවකයින් 52 දෙනාගෙන් බේරුම්කරණයට කිසි දිනක නොපැමිණි පහත සඳහන් සේවකයින් තිදෙනාගේ අයිතිවාසිකම් ලබා ගැනීම ඔවුන් විසින් අතහැර දැමුවා සේ සලකා එම සේවකයින් වන පහත සඳහන් පුද්ගලයින් තිදෙනාට කිසිම ගෙවීමක් නොකිරීමට පාර්ශවයන්ගේ එකඟත්වයෙන් මවිසින් තීරණය කරන ලදී.

සේවා අංක 61 - ඩබ්. එම්. සී. බණ්ඩාර
සේවා අංක 89 - ආර්. ඩී. සී. රණවීර සහ
සේවා අංක 198 - එච්. එම්. බී. කේ. එස්. ගුණවර්ධන

අවසානයේදී දෙවන වගඋත්තරකාර පාර්ශවය වන ඉන්ටර් ඔරියන්ට් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඉල්ලුම්කාර වෘත්තීය සමිතිය වෙනුවෙන් පෙනී සිටි නියෝජිත ඊ. වී. එන්. කබ්රාල් මහතාගේ එකඟත්වයෙන් මුදල් ගෙවා එම මුදල් ලබා ගත්බවට සේවකයින් අත්සන් කරන ලද ගෙවීම් ලේඛනය "X" වශයෙන් සලකුණු කොට එය බේරුම්කරණ නඩු ගොනුවට ඇතුළත් කරන ලදී.

ගෙවීම සඳහා සුදුසුකම් ලද පහත සඳහන් සේවකයින් 11 දෙනාට පෞද්ගලිකව බේරුම්කරණය ඉදිරියට පැමිණ නැති අතර, ඔවුන් වෙනුවෙන් ඔවුන්ගේ නෑදෑ හිතවතුන් අවශ්‍ය නීතිමය ලියවිලි, දිවුරුම් පෙත්සම් ආදිය වගඋත්තරකාර පාර්ශවයට ඉදිරිපත් කොට ඔවුන්ගේ අවශ්‍යතාවයද තහවුරු කොට ගෙවීම් ලබා ගන්නා ලදී. ඔවුන්ගේ විස්තර මෙසේය :- (මෙම සේවකයින් 11 දෙනාද "X" ලේඛනයෙහි සඳහන් සේවකයින් 52 දෙදෙනාට ඇතුලත්ය.)

01. එච්.ඒ.ආර්. පෙරේරා (සේ. අ. 264)
- වෙනුවෙන් එච්.ඒ.පී. ධම්මිකා
02. එච්.එම්.එස්.කේ. හුන්ගම්පල (සේ.අ. 251)
- වෙනුවෙන් එම්.බී.පී.බී. සේමසිංහ
03. එම්.බී.පී.එම්. පෙරේරා (සේ. අ. 247)
- වෙනුවෙන් එම්.එස්.එස්. සුදසිංහ
04. කේ. මුරුගානන්දන් (සේ. අ. 81)
- වෙනුවෙන් කුමාරසාමි වඩිවේලු
05. එල්.කේ. වීරසිංහ (සේ. අ. 228)
- වෙනුවෙන් පී. කුමාරි
06. ඩී.යූ.පී. දසනායක (සේ. අ. 213)
- වෙනුවෙන් යූ.පී.බී. වීරසිංහ
07. බී.ඩී.එස්.සුහසිංහ (සේ. අ. 255)
- වෙනුවෙන් ඩී.ජේ. සුහසිංහ
08. ඩබ්ලිව්.එස්.ප්‍රසන්න (සේ. අ. 187)
- වෙනුවෙන් ආර්.එල්.ඩී. සෞම්‍යකුමාරි
09. ටී.එම්.සරත් (සේ. අ. 116)
- වෙනුවෙන් වැරලි අර්සලා මැතිව්ස්
10. බී. චන්ද්‍රසේන (සේ. අ. 63)
- වෙනුවෙන් රෝහිනී කපුරුආරච්චි
11. කේ.කේ.එන්. දයානන්ද (සේ. අ. 27)
- වෙනුවෙන් එම්.වයි. ප්‍රියන්ත මුණසිංහ

මෙම සේවකයින් 11 දෙනා හෝ ඔවුන් වෙනුවෙන් ඇටෝර්නි බලපත්‍ර සහ වෙනත් ලියවිලි ඉදිරිපත් කිරීම සඳහා අවස්ථා කීපයකදී ඔවුන්ගේ නෑදෑ හිතවතුන් පැමිණ සිටි අතර, එම නෑදෑ හිතවතුන් වෙනුවෙන් සාධාරණ මුදලක් ලබා ගැනීම සඳහා ඔවුන් වෙහෙස දරා ඇත. ඔවුන් ඉදිරිපත් කල ලියකියවිලි පරීක්ෂා කිරීමෙන් පසු එම සේවකයින් වෙනුවෙන් පාරිතෝෂිත මුදලක් ගෙවීමට වගඋත්තරකාර පාර්ශවයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත.

එබැවින් මෙම සේවකයින් 11 දෙනා වෙනුවෙන් අදාළ දීමනා ලබා දීමට සියළු පාර්ශවයන් එකඟත්වය පළ කල බැවින් 2013.07.05 වෙනි දින ඔවුන්ට ගෙවීම් කරන ලද අතර, එම මුදල් ලද මෙම සෑම දෙනාම "X" ආකෘතියට අත්සන් තබා ඇත. ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් ඊ.වී.එන්. කබ්රාල් මහතාද 02 වන වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් අධ්‍යක්ෂ පණ්ඩු වීරසේකර මහතාද අත්සන් තබා ඇත.

සියළු කරුණු එක් කොට ගත් කළ ඉල්ලුම්කාර පාර්ශවය සහ 02 වන වගඋත්තරකාර පාර්ශවය අතර, ඇති කර ගන්නා ලද සමථය සාධාරණ සහ ප්‍රායෝගික එකක් බව මම පිළිගනිමි. කම්කරු කොමසාරිස් ජනරාල්වරිය විසින් යථා කාලයේදී මෙම සමථ ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ඇත.

මෙම සමථය සාධාරණ බව මමද පිළිගනිමි.

ටී. පියසෝම,
බේරුම්කරු.

දිනය : 2013.07.19

**Schedule for settlement on case No. A: 3236**

(QUALIFIED FOR EXGRATIA PAYMENT - WITHOUT PREJUDICE TO OUR RIGHTS)

| *S/n* | *Name of Employee* | *Emp No.* | *D.O.J.* | *last Worked* | *Cont. to Expire on* | *Last Salary Drawn* | *Period of Service* | *Period Served (Months)* | *Exgratia Payment* | *Medical Fund Balance* | *Final Pa. Payment* |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Hairschandra H.P.R | 11 | 04.06.2003 | 03.05.2006 | 30.06.2006 | 4,350.00 | 3 yearas, 0 Months, 26 days | 37 | 33,000.00 | 3,900.00 | 36,900.00 |
| 2 | Herath R.A.I.U | 13 | 30.05.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 1 Months, 0 days | 37 | 33,000.00 | 3,676.00 | 36,676.00 |
| 3 | Karunaratne K.V.S | 17 | 30.05.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 1 Months, 0 days | 37 | 33,000.00 | 1,650.00 | 34,650.00 |
| 4 | Dayananda K.K.N.W | 27 | 04.06.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 0 Months, 26 days | 37 | 33,000.00 | 1,571.00 | 34,571.00 |
| 5 | Ranasinghe L.G | 37 | 04.06.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 0 Months, 26 days | 37 | 33,000.00 | 1,425.00 | 34,425.00 |
| 6 | Wasantha R.B | 48 | 07.06.2003 | 03.05.2006 | 30.06.2006 | 4,350.00 | 3 years, 0 Months, 23 days | 37 | 33,000.00 | 7,500.00 | 40,500.00 |
| 7 | Weerasooriya M.J | 49 | 30.05.2003 | 03.05.2006 | 13.09.2006 | 4,625.00 | 3 years, 3 Months, 14 days | 39.5 | 33,000.00 | 1,595.00 | 34,595.00 |
| 8 | Sirikumara D.S | 53 | 30.05.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 1 Months, 0 days | 37 | 33,000.00 | 7,500.00 | 40,500.00 |
| 9 | Wijendra W.A.J.L | 54 | 04.06.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 0 Months, 26 days | 37 | 33,000.00 | 7,500.00 | 40,500.00 |
| 10 | Premarathna C. | 55 | 16.06.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 0 Months, 14 days | 36.5 | 33,000.00 | 728.00 | 33,728.00 |
| 11 | Bandara W.M.C | 61 | 05.06.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 0 Months, 25 days | 37 | 33,000.00 | 558.00 | 33,558.00 |
| 12 | Chandrasena V. | 63 | 06.06.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 0 Months, 24 days | 37 | 33,000.00 | 2,304.00 | 35,304.00 |
| 13 | Lakshan W.A.T | 79 | 07.06.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 0 Months, 23 days | 37 | 33,000.00 | 994.00 | 33,994.00 |
| 14 | Maruganadham K. F | 81 | 30.05.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 0 Months, 25 days | 37 | 33,000.00 | 7,500.00 | 40,500.00 |
| 15 | Ranasinghe P.R.S.N | 87 | 05.06.2003 | 03.05.2006 | 30.06.2006 | 4,350.00 | 3 years, 0 Months, 25 days | 38 | 33,000.00 | 7,500.00 | 40,500.00 |
| 16 | Ranaweera R.D.L | 89 | 06.06.2003 | 03.05.2006 | 30.06.2006 | 4,625.00 | 3 years, 0 Months, 24 days | 37 | 33,000.00 | 1,215.00 | 34,215.00 |
| 17 | Siriwardana W.A.A | 95 | 30.05.2003 | 03.05.2006 | 30.06.2006 | 4,000.00 | 3 years, 1 Months, 0 days | 37 | 33,000.00 | 730.00 | 33,730.00 |
| 18 | Bandara E.G.P.J | 115 | 20.07.2003 | 03.05.2006 | 30.06.2006 | 3,500.00 | 2 years, 11 Months, 10 days | 35 | 33,000.00 | 1,310.00 | 34,310.00 |
| 19 | Sarath T.M | 116 | 20.07.2004 | 03.05.2006 | 30.06.2006 | 4,350.00 | 1 years, 11 Months, 10 days | 35 | 33,000.00 | 0.00 | 33,000.00 |
| 20 | Senavirathna B. | 118 | 22.07.2004 | 03.05.2006 | 18.07.2006 | 4,350.00 | 1 years, 11 Months, 26 days | 36 | 33,000.00 | 7,250.00 | 40,250.00 |
| 21 | Nandana P. | 128 | 16.08.2003 | 03.05.2006 | 14.09.2006 | 4,000.00 | 3 years, 0 Months, 29 days | 37 | 33,000.00 | 2,631.00 | 35,631.00 |
| 22 | Samaraweera K.W.J.R | 131 | 18.08.2003 | 03.05.2006 | 17.09.2006 | 4,350.00 | 3 years, 0 Months, 30 days | 37 | 33,000.00 | 7,250.00 | 40,250.00 |
| 23 | Gunaratne A.V.N | 138 | 22.09.2003 | 03.05.2006 | 20.09.2006 | 4,350.00 | 2 years, 11 Months, 29 days | 36 | 33,000.00 | 1,513.00 | 34,513.00 |
| 24 | Wijesooriya R.P | 142 | 01.10.2003 | 03.05.2006 | 29.09.2006 | 4,350.00 | 2 years, 11 Months, 28 days | 36 | 33,000.00 | 1,543.00 | 34,543.00 |
| 25 | Lakminige L.G.C | 149 | 16.10.2003 | 03.05.2006 | 15.10.2006 | 4,350.00 | 2 years, 11 Months, 29 days | 36 | 33,000.00 | 1,706.00 | 34,706.00 |
| 26 | Wijeratna D. | 160 | 01.12.2003 | 03.05.2006 | 29.11.2006 | 4,350.00 | 2 years, 11 Months, 28 days | 36 | 33,000.00 | 1,328.00 | 34,328.00 |
| 27 | Perera B.A.N | 169 | 01.06.2004 | 03.05.2006 | 30.05.2006 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 0.00 | 22,000.00 |
| 28 | Kumara D.A.N.T | 173 | 14.05.2004 | 03.05.2006 | 13.05.2006 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 0.00 | 22,000.00 |
| 29 | Vidanaarachchi W.A.S | 183 | 14.05.2004 | 03.05.2006 | 13.05.2006 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 6,000.00 | 28,000.00 |
| 30 | Prasanna W.S | 187 | 14.05.2004 | 03.05.2006 | 13.05.2006 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 1,203.00 | 23,203.00 |

2-G 18228

**Schedule for settlement on case No. A: 3236**

(QUALIFIED FOR EXGRATIA PAYMENT - WITHOUT PREJUDICE TO OUR RIGHTS)

| *S/n* | *Name of Employee* | *Emp No.* | *D.O.J.* | *last Worked* | *Cont. to Expire on* | *Last Salary Drawn* | *Period of Service* | *Period Served (Months)* | *Exgratia Payment* | *Medical Fund Balance* | *Final Pa. Payment* |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 31 | Rathnayaka W.S.A | 195 | 14.05.2004 | 03.05.2006 | 13.05.2006 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 1,685.00 | 23,685.00 |
| 32 | Jayaweera B.K | 196 | 14.05.2004 | 03.05.2006 | 13.05.2006 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 6,000.00 | 28,000.00 |
| 33 | Ekanayake W.E.M.J | 197 | 14.05.2004 | 03.05.2006 | 13.05.2006 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 735.00 | 22,735.00 |
| 34 | Gunawardana H.M.R.K.S | 198 | 14.05.2004 | 03.05.2006 | 13.05.2006 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 1,050.00 | 23,050.00 |
| 35 | Dasanayaka D.U.P | 213 | 14.05.2004 | 03.05.2006 | 13.05.2006 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 980.00 | 22,980.00 |
| 36 | Rajarathna H.G | 217 | 10.07.2004 | 03.05.2006 | 08.06.2006 | 4,000.00 | 1 years, 10 Months, 29 days | 23 | 22,000.00 | 1,450.00 | 23,450.00 |
| 37 | Priyantha S.A.J.A | 219 | 10.07.2004 | 03.05.2006 | 08.06.2006 | 4,000.00 | 1 years, 10 Months, 29 days | 23 | 22,000.00 | 1,450.00 | 23,450.00 |
| 38 | Najeem N.M.M | 221 | 10.07.2004 | 03.05.2006 | 08.06.2006 | 4,000.00 | 1 years, 10 Months, 29 days | 23 | 22,000.00 | 85.00 | 22,085.00 |
| 39 | Wickramasinghe W.A.H | 225 | 10.07.2004 | 03.05.2006 | 08.06.2006 | 4,000.00 | 1 years, 10 Months, 29 days | 23 | 22,000.00 | 1,225.00 | 23,225.00 |
| 40 | Weerasinhe L.K | 228 | 10.07.2004 | 03.05.2006 | 08.06.2006 | 4,000.00 | 1 years, 10 Months, 29 days | 23 | 22,000.00 | 693.00 | 22,693.00 |
| 41 | Udayakumara A.I | 239 | 02.08.2004 | 03.05.2006 | 01.08.2006 | 4,000.00 | 1 years, 11 Months, 30 days | 24 | 22,000.00 | 1,425.00 | 23,425.00 |
| 42 | Dissanayaka D.M.E | 242 | 03.09.2004 | 03.05.2006 | 31.08.2006 | 3,500.00 | 1 years, 11 Months, 28 days | 24 | 22,000.00 | 1,400.00 | 23,400.00 |
| 43 | Perera N.D.P.M.W | 247 | 01.11.2004 | 03.05.2006 | 30.10.2006 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 1,560.00 | 23,560.00 |
| 44 | Wijesundara W.L.K.K | 248 | 01.11.2004 | 03.05.2006 | 30.10.2006 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 4,500.00 | 26,500.00 |
| 45 | Hungampola H.M.S.K.N | 251 | 01.12.2004 | 03.05.2006 | 29.11.2006 | 4,000.00 | 1 years, 11 Months, 28 days | 24 | 22,000.00 | 1,325.00 | 23,325.00 |
| 46 | Wijewickrama W.M.P | 252 | 01.12.2004 | 03.05.2006 | 29.11.2006 | 4,000.00 | 1 years, 11 Months, 28 days | 24 | 22,000.00 | 1,550.00 | 23,550.00 |
| 47 | Chaminda M.A.Y | 253 | 01.12.2004 | 03.05.2006 | 29.11.2006 | 3,500.00 | 1 years, 11 Months, 28 days | 24 | 22,000.00 | 1,325.00 | 23,325.00 |
| 48 | Subasinghe D.B.S.F | 255 | 01.12.2004 | 03.05.2006 | 29.11.2006 | 4,000.00 | 1 years, 11 Months, 28 days | 24 | 22,000.00 | 1,650.00 | 23,650.00 |
| 49 | Perera H.A.C.H.K | 259 | 18.01.2005 | 03.05.2006 | 16.01.2007 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 1,407.00 | 23,407.00 |
| 50 | Kumara G.K.M.D | 260 | 17.01.2005 | 03.05.2006 | 15.01.2007 | 4,000.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 1,050.00 | 23,050.00 |
| 51 | Hettiarachchi H.K.R.M | 263 | 21.01.2005 | 03.05.2006 | 19.01.2007 | 3,500.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 1,275.00 | 23,275.00 |
| 52 | Perera H.A.R.W | 264 | 22.01.2005 | 03.05.2006 | 20.01.2007 | 3,500.00 | 1 years, 11 Months, 29 days | 24 | 22,000.00 | 1,530.00 | 23,530.00 |
| | | | | | | **Total** | | | 1,430,000.00 | 124,930.00 | 1,554,930.00 |

09 - 915

*මගේ අංකය :* IR/13/27/2008.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.06.10 දිනැති හා අංක 1709/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.06.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් පොකුණුවිට, මීමන, ප්‍රේමතිලක මාවත හි පදිංචි සී. ඩී. ලංකේශ්වර මහතා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, කිරුල පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.06.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය :* IR/13/27/2008.

**කාර්මික අධිකරණයේ දී ය.**

01. සී. ඩී. ලංකේශ්වර මහතා,
"ශාන්ති",
ප්‍රේමතිලක මාවත,
මීමන,
පොකුණුවිට. (ඉල්ලුම්කරු)

එදිරිව

නඩු අංකය : ඒ/3391

02. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200,
කිරුල පාර,
කොළඹ 05. (වගඋත්තරකරු)

ප්‍රදානය

1957 අංක 14 හා 1957 අංක 62 1962 අංක 4, 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2011.06.03 දින මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

පූර්වෝක්ත යොමුව පරිදි,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පානදුර ඩිපෝවට අනුයුක්තව සේවය කරමින් සිටියදී 2003.08.08 දින සිදු වූයේ යැයි කියනු ලබන හදිසි අනතුරක් හේතුවෙන් සී. ඩී. ලංකේශ්වර මහතා විසින් සේවයට වාර්තා කිරීමට නොහැකි වූ කාල සීමාව සඳහා ඉදිරිපත් කරනු ලැබූ රෝහල් වෛද්‍ය සහතික සැලකිල්ලට ගෙන අනතුරු නිවාඩු වශයෙන් සලකා සම්පූර්ණ වැටුප් ලබා දෙන ලෙසට කරන ඉල්ලීම යුක්තිසහගතද යන්න හා යුක්තිසහගත වන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ."

කාර්මික ආරාවුල් පනතේ සම්පාදිත නියෝග සංග්‍රහය ප්‍රකාරව දෙපාර්ශවයේ ප්‍රකාශ ලබා ගෙන හුවමාරු කර ගැනීමෙන් පසුව දෙපාර්ශවය කැඳවූ මුල් අවස්ථාවේදීම "යොමුව" සම්බන්ධයෙන් යම් සමථයක් නොවූ බැව් ප්‍රකාශ වීමෙන් අනතුරුව විභාගය ආරම්භ කරන ලෙසට ඉල්ලුම්කරු වෙත භාර කරවන ලදී.

ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත ඩී. කොල්වින් පීරිස් මහතා පෙනී සිටි අතර, වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ආයතනයේ නීති නිලධාරී සමග රජයේ නීතිඥ නවීෂා ජයසිංහ මෙනවියද පෙනී සිටියහ. දෙපාර්ශවයටම මූලික ප්‍රශ්න, හරස් ප්‍රශ්න, නැවත ප්‍රශ්න සඳහා ඉඩ ලබා දී ඇත.

ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලුම්කාර ලංකේශ්වර මහතා සහ නුගේගොඩ ශ්‍රී ලංගම වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍යාචාර්යවරිය සාක්ෂි දුන් අතර, වගඋත්තරකරුවන් වෙනුවෙන් ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරු සාක්ෂි ඉදිරිපත් කළේය.

ආරම්භයේදීම සැලකිය යුතු කරුණක් වනුයේ ඉල්ලුම්කරු හේතු දැක්වීමේ ලිපිය අධිකරණය වෙත වර්ෂ 2011.07.04 දින ඉදිරිපත් කළ අතර, වගඋත්තරකරුවන් වෙනුවෙන් සිය පිළිතුරු ප්‍රකාශය 2011.07.02 වෙනි දිනද, දෙවන පිළිතුරු ප්‍රකාශයක් 2011.08.02 වෙනි දිනද ඉදිරිපත් කර තිබීම වෙයි. එකී පළමු පිළිතුරු ප්‍රකාශයේ සහ දෙවන පිළිතුරු ප්‍රකාශය යන දෙකෙහිම 05 සහ 06 ඡේද යටතේ ඉල්ලුම්කරු වෙත ප්‍රවේශපත් විෂමාචාරයක් සම්බන්ධව චෝදනා පත්‍ර නිකුත් කළ බව සඳහන් වෙතත් මෙම විභාගය අවසානය වන තෙක් එවැනි චෝදනාවන් සම්බන්ධව වචනයකුදු සඳහන්ව නොතිබීම විමතියට කරුණකි. මෙම විභාගය තුළ සාකච්ඡා වූ එකම කරුණ වූයේද, වගඋත්තරකරුවන්ගේ ස්ථාවරය වූයේද ඉල්ලුම්කරු තමාට සිදු වූ හදිසි අනතුර සම්බන්ධයෙන් විධිමත් ආකාරයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් නොකළ හෙයින් වැටුප් සහිත වෛද්‍ය නිවාඩු ලබා නොදීම සාධාරණද යන්නය. ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී සහ නුගේගොඩ ප්‍රධාන වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍ය දිල්මිණී සේනාරත්න මහත්මියගෙන්ද ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරු (දකුණු ප්‍රදේශය) යන සාක්ෂිකරුගෙන්ද සාක්ෂි ඉදිරිපත් කිරීමේදී ද (මේ සම්බන්ධ සාක්ෂි සම්පිණ්ඩනයේදී පසුව සාකච්ඡා කෙරේ.) ඉල්ලුම්කරු ටිකට්පත් විෂමාචාර ක්‍රියාවක නිරත වූ බැවින් චෝදනාපත් ඉදිරිපත් කළ බවක් හෙළි නොවීය.

එසේ නම් වගඋත්තරකරු පූර්වෝක්ත පිළිතුරු ලිපි දෙකෙහිම 05 සහ 06 යන ඡේදවල සඳහන් වන විෂමාචාර චෝදනා නගා තිබීම ප්‍රතික්ෂේප කළ යුතුව ඇති අතර, එසේ සඳහන් කිරීම ඉල්ලුම්කරු කෙරෙහි ද්වේශසහගත ආකාරයෙන් ක්‍රියා කළ බවට හොඳම සාක්ෂියකැයි මගේ හැඟීමයි. ඒ අනුව ඉල්ලුම්කරු කෙරෙහි වගඋත්තරකරුගේ ආකල්පය කෙබඳු දැයි හෙළි වේ. තවද පිළිතුරු ප්‍රකාශයෙහි 08 ඡේදය "වගඋත්තරකරු වෙනුවෙන් තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ මෙම සේවා අත්හිටුවීම යුක්තියසහගත සහ සාධාරණ බවය" සහ දෙවන පිළිතුරු ලිපියේ 09 ඡේදය පරිදි "ඉහත චෝදනා පත්‍ර ප්‍රකාරව පෙනී යන්නේ පෙර වැරදි සහිත පුද්ගලයකු බවය" යන ප්‍රකාශ සහ දෙවන පිළිතුරෙහි 10, 11 ඡේදවල සඳහන් "ඉල්ලුම්කරුට සිදු වූ අනතුරක් සම්බන්ධයෙන් සේවයට වාර්තා කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී ආයතනයේ පිළිවෙත් ප්‍රකාර අනතුරු නිවාඩු ලබා ගැනීමට හැකි වන පරිදි වෛද්‍ය සහතික ඉදිරිපත් නොකිරීම නිසා එම අනතුර සම්බන්ධයෙන් අනතුරු නිවාඩු සඳහා වැටුප් ලබා ගැනීමට නොහැකි වී ඇති බව ගරු අධිකරණයට ගෞරවයෙන් සැලකර සිටියි" යන්න හා 11 ඡේදයේ දැක්වෙන "වගඋත්තරකරු වෙනුවෙන්

වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ මෙම සේවා අත්හිටුවීම යුක්තියසහගත හා සාධාරණ බවයි" යන සම්ප්‍රකාශ මෙම බේරුම්කරණය සඳහා සඳහන් යොමුව සම්බන්ධ විභාගය පුරාවට වගඋත්තරකරුවන් වචනයකුදු සාකච්ඡා කොට නැති බවයි.

එකී කරුණු පසුව සැලකිල්ලට ගැනීමට පසෙක තබා මෙතැන් සිට විභාගයේදී කරුණු ඉදිරිපත් වූ ආකාරය විමසා බලමු.

2011.12.05 දින ඉල්ලුම්කාර චන්දන දුමිඳු ලංකේශ්වර යන අය තම නඩුව ඉදිරිපත් කරමින් 1986.10.16 දින වගඋත්තරකාර ආයතනයේ සේවයට බැඳුණු බවත්, කොන්දොස්තරවරයෙකු ලෙස සේවය කරමින් සිටියදී, 2003.08.08 දින වීරවිලදී බස්රථය තුළ තවත් මගියෙකුගේ ඇගේ පැටලී වැටීමෙන් වම් කකුලේ ඇටයක් බිඳීමෙන් අනතුරක් වූ බව හෙළි කළේය. පැ/01 අනුව කතරගම ඩිපෝවේ සහකාර කළමනාකාර (ධාවන) විසින් පානදුර ඩිපෝ කළමනාකාර වෙත "සී. ඩී. ලංකේශ්වර පඩි අංක 319 කොන්දොස්තර හදිසි අනතුරු නිවාඩු අනුමත කිරීම" යන ශීර්ෂය ලිඛිතව දන්වා යවන ලිපියේ පහත කරුණු දක්වා ඇත.

2003.08.08 දින ලංකේශ්වර මහතා බස්රථය තිරිංග කිරීමේදී වෙනත් මගියකුගේ ඇගේ ගැටී බස්රථය තුළ වැටීමෙන් වම් කකුලේ ආබාධයක් ඇති වූ බවද, නැවත පසුදින ආබාධය වැඩිවී ඇති බැවින් රෝහල් ගතවීම සඳහා වෛද්‍ය 14 පෝර්මය මගින් කතරගම රෝහල වෙත ප්‍රතිකාර සඳහා යවන ලද බවද, මේ බව ඩිපෝවට දැනුම් දී වෙනත් කොන්දොස්තර මහතෙකු ගෙන්වා බසය ධාවනයට යොදවන ලද බවද පැ/01 ලේඛනය මගින් සාක්ෂි ලබා දුනි.

මෙම පැ/01 ලේඛනය ඔප්පු කිරීමේ භාරයට යටත් කරන ලෙස වගඋත්තරකාර ආයතනයේ නීතිඥතුමිය ඉල්ලා ඇතත්, එම ලිපිය වගඋත්තරකාර ආයතනයේ එක් ඩිපෝවක සිට තවත් ඩිපෝවක් වෙත වගකිවයුතු නිලධාරියකුගේ අත්සනින් යවන ලද්දක් බැවින් පැ/01 ලේඛනය අත්සන් තබා නිල ලාංඡන සමග ඇති ලේඛනයකි. ඔප්පු කිරීමේ භාරයක් නොපවතින බව මගේ හැඟීමයි.

මීට අමතරව "M 14" පෝර්මය ඩිපෝවේ සිට අනතුරට පත් රෝගියා කතරගම රෝහල වෙත යවන ලද ලිපිය සහ පැ/03 දරන වෛද්‍යවරයා විසින් නිවාඩු අනුමත ලිපිය පැ/04 දරන වෛද්‍යවරයාගේ රෝගී විනිශ්චය තුන්ඩුවද ඔප්පු කිරීමේ භාරයෙන් ඉවත් විය යුතුය. පැ/04 "රෝහලෙන් පිටත ගෙන යාමට නොවේ" යැයි සටහන්ව ඇත. ඔප්පු කිරීමේ භාරයට ගැනේ නම් අදාළ වෛද්‍යවරයා සාක්ෂි සඳහා කැඳවිය යුතුය. ඒ සඳහා හෙතෙම ගෙන්වා ගැනීම අසීරු යැයි සිතමි. එහි සටහන් හා වෛද්‍යවරයාගේ අත්සන පිළිගනිමි.

තවදුරටත් පැ/07 ඉදිරිපත් කරමින් නැවත සේවයට සුදුසු බැව් වෛද්‍ය නිර්දේශය ලත් හෙයින් සේවයට වාර්තා කළ බවත්, තමා අනතුරු නිවාඩු ඉල්ලා සිටියදී වගඋත්තරකරුවන්ගෙන් සුහද ප්‍රතිචාරයක් නොලැබුනු බවත්, තමාට අඩ වැටුප් පමණක් ලබා දුන් බැවින් 2004 වර්ෂයට අදාළ නිවාඩු නොලැබීම හේතුවෙන් පඩි රහිත නිවාඩු ලබා ගැනීමේ චෝදනාවට ලක් කොට සේවය තහනම් කරන ලද බවත් හෙළි කළේය. සේවා තහනමෙන් පසු විනයානුකූල දඬුවම් ලබා දීමට එරෙහිව අභියාචනා කළ බවත්, පැ/09 මගින් හෙළි කෙළේය. පැ/09 ප්‍රකාරව

01. දින 07ක වේතන දඩයක්ද,

02. තදින් අවවාද කිරීමක්ද සහිතව දඬුවම් නියම කොට ඇත. අනතුර හේතුවෙන් අසනීප නිවාඩු වෙනුවට අඩ වැටුප් නියම කිරීම අසාධාරණ යැයි අභියාචනා කිරීම හේතුවෙන් පැ/10 ලේඛනය පරිදි ඩිපෝ කළමනාකරතැනගේ නිර්දේශය ලබා දී ඇති අතර, රජයේ වෛද්‍ය සහතික ඉදිරිපත් කර ඇති බවත්, ප්‍රධාන කාර්යාලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන 2005.07.22 දින දන්වා ඇත. එකී ලිපිය මගින් "නමුත් ඒ සඳහා අඩ පඩි නිවාඩු අනුමත කර ඇත්තේ එවකට පැවති පරිපාලනයේ ප්‍රමාද දෝෂයකින් බව හැඟී යන බැවින් එම සේවක තැනට හිඟ වැටුප් රහිතව අනතුරු නිවාඩු හිමිකම පමණක් අනුමත කරන බව මෙයින් දන්වමි" යන්නෙන් පැ/10 හෙළිදරව් කරයි. අවසන් වශයෙන් ඉල්ලුම්කරු තමාට අඩ වැටුප් ලෙස ගෙවන ලද වැටුපේ ඉතිරි කොටස ඉල්ලා සිටින බවත් කියා සිටි. නඩු ගොනුවේ 34 පිටුවෙහි ඉල්ලා සිටින මුළු මුදල රු. 30,000ක් බව දැක්වේ.

තවද 1967 අංක (1) දරන නීති කොට්ඨාස චක්‍රලේඛය කම්කරු වන්දි ආඥා පනත ප්‍රකාරව කම්කරු වන්දි ඉල්ලන සේවකයින් සඳහා අනුකූලව සම්පාදිත ලේඛනයකි. එහි 3 ඡේදය ප්‍රකාරය "ඩිපෝ අධිකාරීතැන හෝ ඩිපෝ ඉංජිනේරු විසින් ඒ කම්කරුවාට වෛද්‍ය නිලධාරියා කියා ඇති කාලයේදී සේවය නොපැමිණෙන ලෙස දැන්විය යුතුය" ......................................... ඒ සේවකයා නොපැමිණි කාල පරිච්ඡේදයට පඩි ගෙවීමට ඩිපෝ අධිකාරීතැනට නියම කළ හැකිය. ...................... තුවාල ලත් සේවකයකුගේ පඩිය ගෙවීම කවදාවත් නතර නොකළ යුතුය. එය යටකී තීරණය ලැබෙන තුරු කොයි විටත් ගෙවිය යුතුයි" මෙහි සඳහන් ප්‍රතිපාදන වගඋත්තරකරුවන් විශේෂයෙන් සේවක මණ්ඩල කළමනාකාරතැන උල්ලංඝනය කොට ඇත. එපමණක් නොව ඉල්ලුම්කරු වැඩ තහනමකටද, දින 07 ක/05ක දඩයකටද, තරයේ අවවාද කිරීමකටද ලක් කොට ඇත. එය ආයතනයේ වරදක් බව පසුව වෙනත් සේවක මණ්ඩල කළමනාකාර මහතකු විසින් පිළිගෙන ඇත.

මෙම ඉල්ලුම්කරුහට මහත් අගතියක් වගඋත්තරකරුවන් විසින් සිදු කොට ඇති බැව් හෙළිදරව් වේ. ඒ සඳහා ඔවුන් විසින් වන්දියක් වශයෙන් ඉල්ලන ලද හිඟ වැටුපට අමතරව තවත් වන්දි මුදලක් ගෙවීම යුක්ති යුක්තයයි තීරණය කරමි. අනතුරු කාලයට අදාළ හිඟ වැටුපෙන් අඩක් නොගෙවීම. ඊට අදාළව වැඩ තහනමකට ලක් කිරීම විනය ව්‍යවස්ථාවට පටහැනිය දඬුවම් 02 ලබාදීම යන කරුණු මත ඉල්ලුම්කරුට මානසික ඉංජුරියාවක් සිදුව ඇත. තවද වගඋත්තරකරුවන්ගේ ප්‍රතිඋත්තරයේ දැක්වෙන විෂමාචාරය සිදු නොවූවක් සේ සැලකිය හැක්කේ විභාග කාලය පුරාව වගඋත්තරකරුවන් එකී විෂමචාරය පිළිබඳව වචනයකුදු සාකච්ඡා නොකිරීමය. එමගින්ද ඉල්ලුම්කරුට අගතියක් සිදුව ඇති බැව් මාගේ හැඟීමයි. ඉල්ලුම්කරුවන් වෙනුවෙන් සාක්ෂි ඉදිරිපත් කිරීමට පැමිණි නුගේගොඩ ලංගම වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍ය සුජානි නිල්මිණී සේනාරත්න මියට අනුව මෙම ඉල්ලුම්කරුට අනතුරු නිවාඩු අනුමත කොට තිබූ බවද, ඔහු වෙනුවෙන් වෙනම ගොනුවක් පවත්නා බවද හෙළි කර ඇත.

වගඋත්තරකරුවන් වෙනුවෙන් ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරු (දකුණ) දයා රංජිත් නමැති අයද සාක්ෂි ඉදිරිපත් කළේය.

වගඋත්තරකාර පාර්ශවය ආර්/01 සිට ආර්/14 දක්වා ලේඛන ඉදිරිපත් කරමින් ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත.

දෙපාර්ශවයේ ලිඛිත දේශන සලකුණු කරන ලද ලේඛන සහ ඔප්පු කිරීමේ භාරයට යටත් ලේඛනද සලකා බලන ලදී.

මේ අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පානදුර ඩිපෝවට අනුයුක්තව සේවය කරමින් සිටියදී 2003.08.08 දින සිදු වූයේ යැයි

කියනු ලබන හදිසි අනතුරක් හේතුවෙන් සී. ඩී. ලංකේශ්වර මහතා විසින් සේවයට වාර්තා කිරීමට නොහැකි වූ කාල සීමාව සැලකිල්ලට ගෙන අනතුරු නිවාඩු වශයෙන් සලකා සම්පූර්ණ වැටුප් ලබා දෙන ලෙසට කරන ඉල්ලීම යුක්ති සහගත වේ.

01. ඒ අනුව ලැබිය යුතු සහනයන් ලෙස ඔහුට හිමි මූල්‍යමය වන්දිය එනම්, නොගෙවන ලද අඩ වැටුප් සඳහා රුපියල් 30,000ක් ගෙවීමක් කිරීම.

02. වගඋත්තරකාර පාර්ශවයේ වරදින් චෝදනා පත්‍ර නිකුත් කිරීම, දණ්ඩන නියෝග 2ක් නියම කිරීම ආදී දඩුවම් ඉල්ලා අස් කොට ගැනීම ආදී සහනයන් සිදු කිරීම කෙරෙහි වගඋත්තරකරුවන්ගේ අවධානය යොමු විය යුතු යැයි සිතමි.

තවද නීති නිලධාරිගේ පිළිතුරු ලිපියෙහි සඳහන් වැරදි ඉල්ලුම්කරු සිදු නොකොට ඇත්නම් ඒ සඳහා වගඋත්තරකරුවන් ඊට නිසි ප්‍රතිචාර දැක්වීම වැනි ක්‍රියා මාර්ගයක් ගැනීමද මැනවැයි සිතමි. මෙය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු යැයි නිගමනය කරමි.

මෙය යුක්තිසහගත හා සාධාරණ ප්‍රදානය කැයි තහවුරු කරමි.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ බේරුම්කාර
මණ්ඩලයේ සාමාජික.

2013 ජුනි මස 28 වැනි දින දී ය.

09 - 916

---

*මගේ අංකය* : IR/13/26/2008.

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ  කරන ලද 2010.11.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් පාදුක්ක, මලගල, අංක 167 හි එන්.පී. බාලසූරිය බුලත්සිංහල, ඇගල්ඔය, පොල්ගහකන්ද, ආර්.ඒ.ඩී. නිහාල් සහ පොකුණුවිට, කනේවල, ශාන්ති මාවත, "චන්ද්‍රාවාස" හි, එච්.ඒ. ජගත්චන්ද්‍ර යන සේවකයින් තිදෙනා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, කිරුල පාර, අංක 200 හි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.06.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 අගෝස්තු මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : අයි.ආර්./13/26/2008

කාර්මික අධිකරණයේ දී ය.

එක් පාර්ශවයක් වශයෙන්

01. එන්. පී. බාලසූරිය,
අංක 167, මලගල,
පාදුක්ක.

02. ආර්.ඒ.ඩී. නිහාල්,
පොල්ගහකන්ද,
ඇගල්ඔය,
බුලත්සිංහල.

නඩු අංකය : ඒ 3358

03. එච්.ඒ. ජගත්චන්ද්‍ර,
"චන්ද්‍රාවාස",
ශාන්ති මාවත,
කනේවල,
පොකුණුවිට.

එදිරිව

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුල පාර, කොළඹ 05.

වගඋත්තරකාර පාර්ශවය

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2010.11.10 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

බේරුම් කිරීම සඳහා සැලකිල්ලට ගත යුතුව තිබුණු කරුණු වූයේ :-

01. "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හොරණ ඩිපෝවට අනුයුක්තව සේවය කරමින් සිටි V වන ශ්‍රේණියේ නිලධාරීන් වන එන්. පී. බාලසූරිය හා ආර්. ඒ. ඩී. නිහාල් සහ සහකාර කළමනාකර (පාලන) එච්. ඒ. ජගත්චන්ද්‍ර යන මහත්වරුන්ගේ වැඩ තහනම් කර තිබූ 2006.06.10 දින සිට 2006.10.10 දින දක්වා වූ කාල සීමාව සඳහා නොගෙවන ලද අඩ වැටුප් ලබා ගැනීමට හිමිකම් ලබන්නේද යන්න හා එලෙස හිමිකම් ඇත්නම් එය කෙබඳු ප්‍රමාණයක මුදලක් ඔවුන් එකිනෙකාට ගෙවිය යුතුද යන්න හා

02. ඉහතින් නම් සඳහන් කරන ලද සේවකයින් තිදෙනාගේ වැඩ තහනම් කර තිබූ කාල සීමාව තුළදී ඔවුන්ට උසස්වීම් සඳහා අයදුම් කිරීමට තිබූ ඉඩ ප්‍රස්ථා අහිමිවීමක් සිදු වූයේද යන්න හා එසේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ."

කාර්මික ආරවුල් පනතේ සම්පාදිත නියෝග සංග්‍රහයේ සඳහන් පරිදි දෙපාර්ශවයේ ලිපි හුවමාරු කරවීමෙන් පසුව අදාළ යොමුව සම්බන්ධයෙන් යම් සමථයක් වෙන්දැයි විමසන ලදුව එසේ සමථයක් නොමැති බැව් මා වෙත දැන්වීමෙන් පසුව විභාගය සඳහා ඉල්ලුම්කරුවන්ට ඉදිරිපත් වන ලෙස දැන්වීම්.

ඉල්ලුම්කරුවන් තිදෙනා වෙනුවෙන් නියෝජිත ඒ.ඩී. වික්‍රමසිංහ මහතා පෙනී සිටි අතර, වගඋත්තරකරුවන් වෙනුවන් රජයේ නීතිඥ තවීෂා ජයසිංහ වෙනවිය අපහට සහාය ලබා දුන්හ. දෙපාර්ශවයටම හරස් ප්‍රශ්න, නැවත ප්‍රශ්න ආදී පියවරයන් මගින් සාධාරණ විනිශ්චයක් ලබා ගැනීමට ඉඩ දෙන ලදී.

2011.07.20 වෙනි දින විභාගය ආරම්භ කරමින් රණවක ආරච්චිගේ දොන් නිහාල් මහතා සාක්ෂි දෙමින්,

අ. තමා 1997.12.15 වෙනි දින වගඋත්තරකාර මණ්ඩලයේ xii ශ්‍රේණියේ බස් කොන්දොස්තරවරයෙකු ලෙස සේවයට බැඳුණ බවත්,

ආ. වසර 34 ක සේවයකින් පසු දැනට අළුත්ගම ඩිපෝවේ ඩිපෝ කළමනාකරු ලෙස සේවය කරන බවත්,

ඇ. බාලසූරිය මහතා 1977.03.21 වෙනි දින සේවයට බැඳී දැනට හෝමාගම ඩිපෝ සහකාර කළමනාකරු (ධාවන) ලෙස සේවය කරන බවත්,

ඈ. ජගත්චන්ද්‍ර මහතා 1987.11.17 දින බැඳී දැනට මහරගම ඩිපෝවේ සහකාර කළමනාකරු ලෙස සේවය කරන බවද,

ඉ. තිදෙනාම 2006 වර්ෂයේ හොරණ ඩිපෝවේ සහකාර කළමනාකරු (පාලන), සහකාර කළමනාකරු (ධාවන), සහකාර කළමනාකරු (ගමනාගමන) යන තනතුරු තුන හොබවමින් සිටි බවත්,

ඊ. 2006.05.20 දින ස්වාමීන් වහන්සේ නමක් බස්රථ දෙකක් (ලිඛිතව) ඉල්ලා සිටි බවත්, එකී ඉල්ලීම ඩිපෝ කළමනාකාර පී. ගුනෙත්ති මහතාගේ අවධානයට ලක් කරවූ පසු ඒ මහතා සහකාර කළමනාකරු (ධාවන) වෙත ලිඛිත නියෝගයක් දෙමින් "තමා හා සාකච්ඡා කොට අවශ්‍ය පියවර ගන්නා ලෙස" දැනුම් දුන් බවත්, මුදල් අයකොට කොබවක - හොරණ වෙත ධාවනයේ යෙදීමට උපදෙස් දී තිබියදී වැරදි බස්රථ ධාවනය කරවා ඩිපෝවට පාඩු සිදු කළ බවටත්, අනවසරයෙන් බස්රථයක් අනතුරට පත් කිරීමේ චෝදනාව මත ඉල්ලුම්කරුවන් තිදෙනාම වැඩ තහනමට ලක් කළ බවද,

එ. පසුව අනතුර සම්බන්ධයෙන් රියදුරු වෙත විභාගයක් පැවැත්වීමෙන් පසු ඔහුට රු.300/- ක දඩයක් නියම කළ බවද,

ඒ. පසුව සේවා තහනම් කරමින් අනතුර සම්බන්ධ චෝදනාව චෝදනා පත්‍රයෙන් ඉවත් කරගත් බවත්,

ඔ. අදාළ චෝදනා පත්‍රය "පැ/01" ලෙස සලකුණු කිරීමේදී වගඋත්තරකාර පාර්ශවයේ උගත් නීතිඥතුමිය අදාළ චෝදනා පත්‍රය ඔප්පු කිරීමේ භාරයට යටත් කරන ලෙස ඉල්ලා සිටි බවද සාක්ෂාත් කළේය.

චෝදනා පත්‍රය වගඋත්තරකාර පාර්ශවය විසින් ඔවුන්ගේ සේවක මණ්ඩල කළමනාකරුගේ අත්සන යටතේ ඉදිරිපත් කරන ලද්දක් හෙයින්ද, අදාළ චෝදනා පත්‍රය මත විනය විභාගයක් පවත්වා දඬුවම් නියම කොට එකී චෝදනා හා දණ්ඩනයන්ට එරෙහිව අභියාචනයටද ලක් කළ හෙයින් ඔප්පු කිරීමේ භාරයක් අනවශ්‍ය බව මගේ හැඟීමයි.

2006.07.14 දිනැති චෝදනා පත්‍රය ශ්‍රී ලංගම සාමාන්‍යාධිකාරි විසින් නිකුත් කොට ඇත. පැ/02 වශයෙන් සලකුණු කරන ලද සේවය තහනම් කිරීමේ ලිපියද ජ්‍යෙෂ්ඨ සහකාර සේවක මණ්ඩල කළමනාකාර තැනගේ අත්සනින් නිකුත්ව ඇත.

වගඋත්තරකරුවන්ගේ විනය ව්‍යවස්ථාව ලිඛිත නීතියකි. එහි 4:1, 4:2, 4:3 යන ව්‍යවස්ථාවන්ට පටහැනිව මෙම ඉල්ලුම්කරුවන් වෙත අසාධාරණ ලෙස ක්‍රියා කොට ඇත. එනම් බරපතල විෂමාචාර ක්‍රියාවන් පිළිබඳ පිළිවෙත උල්ලංඝනය වී ඇත. ඒ කෙසේද යත්, බරපතල විෂමාචාරයකදී සේවකයා සම්බන්ධව නියමිත බලධාරියා විසින් තීරණය ගත යුතුය. යන්නද (4:2) බරපතල විෂමාචාර ක්‍රියාවකදී මූලික පරීක්ෂණය අවසන් වී මසක් ඇතුළත සේවකයාගේ සේවය තහනම් කළ හැකිද යන්නද (4:3) සේවය තහනම් කළ දින සිට දින 14 ක් තුළ චෝදනා පත්‍රයක් සේවකයා වෙත නිකුත් කළ යුතුය. යන්නද යන කරුණු වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කොට ඇත.

ඉල්ලුම්කරුවන් පැ/05 ලෙස ඉදිරිපත් කරන ලද විනය නියෝගය සේවක මණ්ඩල කළමනාකරු විසින් අත්සන් කොට ඇත. චෝදනා පත්‍රය දඬුවම් හා වෙනත් විනය නියෝග සම්බන්ධව ලේඛන අත්සන් කොට ඇත්තේ "ජ්‍යෙෂ්ඨ සහකාර සේවක මණ්ඩල කළමනාකරු" වුවද විනය ව්‍යවස්ථාව ප්‍රකාරව V වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ පත්වීම, විනය, ස්ථාන මාරු සහ උසස්වීම් චෝදනා පත්‍ර සඳහා අත්සන් කිරීමේ බලය "සභාපති" වෙත පවත්නා බැව් සඳහන් වේ. එය ලිඛිත නීතියක්ව පවතිද්දී ඊට පටහැනිව මෙම ඉල්ලුම්කරුවන්ගේ ඉහත කී ලේඛන ජ්‍යෙෂ්ඨ සේවක මණ්ඩල කළමනාකරු අත්සන් කර තිබීම විනය විරෝධී ක්‍රියාවකි. චෝදනා පත්‍රය විභාගයට නොගෙනම විනය පරීක්ෂණය ඉවත දැමිය යුතුව තිබිණි. එකී ලේඛන සභාපතිගේ අත්සනින් නිකුත් කිරීම අනිවාර්යය අංගයක්ව පැවතිනි. එසේ හෙයින් මෙම ඉල්ලුම්කරුවන් තිදෙනා සම්බන්ධව විනය ක්‍රියාවලිය එනයින්ම ඉවත දැමිය යුතුව තිබිණි. පත්වීම, මාරු කිරීම, සේවය නතර කිරීම සම්බන්ධ ලේඛන විනය ක්‍රියා ගැනීම සම්බන්ධ ලිපි ලේඛන සඳහා ආයතන ප්‍රධානියාගේ අත්සනින් විය යුතු බව ලේඛනගත යුතුව තිබුණද එම නීති අමු අමුවේම වළ දමා ඇති බව පෙනේ. ඉහත කී කරුණු ආයතන ප්‍රධානියා විසින්ම කළ යුතු බව අනිවාර්යය අංගයකි. ඇතැම් විට සභාපතිතුමාගේ බලය වෙනත් නිලධාරියෙකු වෙත අභිනියෝජනය කළා දැයි සැකයකි. එහෙත් පිළිගත් "Deligatus Non Potest Deligare" සිද්ධාන්තය වන්නේ බලය ලත් තැනැත්තා සිය බලය අභිනියෝජනය කළ නොහැකිය යන කරුණ මත මෙම ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ විනය ක්‍රියාවලියට මඳකුදු සැලකිල්ලට නොගෙන ඉවතලිය යුතුව තිබිණි.

වගඋත්තරකරුවන්ගේ අභියාචනා මණ්ඩලයද විනය ව්‍යවස්ථා අනනුකූල බව සාක්ෂිකරු හෙළිකර ඇත. අභියාචනා මණ්ඩලය අධ්‍යක්ෂවරුන්ගෙන් යුත් අනුකාරක සභාවක් මගින් සලකා බැලිය යුතු වුවද, අදාළ අභියාචනා මණ්ඩලය (i). I වන ශ්‍රේණියේ නිලධාරියෙකුගෙන්ද (ii). සම්පාදක නිලධාරිනි වීම සහ (iii). II වෙනි ශ්‍රේණියේ නිලධාරියෙකුගෙන්ද සමන්විත විය. එය විනය ව්‍යවස්ථා 4:8 වගන්තිය උල්ලංඝනය කිරීමක් බව පැහැදිලිය. විනය නියෝගය මෙන්ම අභියාචනා නියෝගයටද අත්සන් තබා ඇත්තේ නිත්‍යානුකූල විනය බලධාරීන් නොවන බව නිහාල් මහතාගේ සාක්ෂියෙන් ඔප්පු විය.

ඉල්ලුම්කරුවන් වෙත පනවා තිබූ සේවා තහනම ඉවත් කිරීමත් සමඟම ඔවුන් වෙත ස්ථාන මාරු ලබා දීමද නොකටයුතුව තිබූ කරුණකි. අභියාචනා නියෝගය පරිදි,

(අ) දින 07 ක වේතන දඩයක් පැනවීම
(ආ) තරයේ අවවාද කිරීම
(ඇ) සේවය තහනම් කළ කාලය සඳහා නියමිත වැටුප අහිමි කිරීම යන දණ්ඩන නියෝග තුනකි. එහෙත් විනය ව්‍යවස්ථාව ප්‍රකාරව යම් සේවකයකුට එක් වරකට පැනවිය හැක්කේ දඬුවම් දෙක යන ව්‍යවස්ථාව එනම්, විනය ව්‍යවස්ථාවේ 12 පිට 10 දඬුවම් උප ඡේදයේ සඳහන් ව්‍යවස්ථාවට පටහැනිව යාමෙකි.

මෙම විභාගයට අදාළ බස් රථ දෙක මුදා හැරීමට හේතුව හිමි නමක් විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත බවද, එකී ඉල්ලුම් පත්‍රයෙහි ඩිපෝ අධිකාරී විසින් ලිඛිත සටහනකින් බලය ලබාදී ඇති හෙයින් මෙම ඉල්ලුම්කරුවන් තිදෙනා සද්භාවයෙන් ක්‍රියා කළා මිස විෂමාචාර ලෙස ක්‍රියා කළ බවක් හෙළි නොවේ. චෝදනා පත්‍රයෙහි පළමුව මෙම තිදෙනා බස් රථ ගෙන ගොස් එක් රථයකට හානි කිරීම සම්බන්ධව චෝදනා නගා ඇතත්, මේ තිදෙන රියදුරන් නොවන බවත්, බස් රථ පැදවූයේ වෙනත් රියදුරන් බව හෙළි වීමෙන් අනතුරුව මෙම ඉල්ලුම්කරුවන් වෙත කරන ලද චෝදනාව ඉල්ලා අස් කොට ගෙන තිදෙනා නැවත සේවයේ පිහිටුවා ඇත. වගඋත්තරකාර පක්ෂය මෙම නිලධාරීන් තිදෙනා කෙරෙහි ද්වේශ සහගත ලෙස ක්‍රියා කළ බව එනයින්ම පැහැදිලි වේ.

චෝදනා පත්‍රය අනුව ඩිපෝවට අය විය යුතුව තිබූ ආදායමක් අහිමි කිරීම යන චෝදනාවට පිළිතුරු දෙන ඉල්ලුම්කරුවන් එදින මෙම බස් රථ දෙකෙහිම ආදායම වෙනත් දිනයන්හි දෛනික ආදායම ඉක්මවා පැවති බැව් සංඛ්‍යාත්මකව පැහැදිලි කොට ඇත. අදාළ බස්රථවලින් ධාවන අංක 25 දරන බස්රථය සෙනසුරාදා දිනයන්හි ධාවනයට නොයොදන රථයක් හෙයින් එම රථය ධාවනයේ යෙදවීමෙන් අතිරේක ආදායමක් උපයා දීමට ඉල්ලුම්කරුවන් පොහොසත්ව ඇත. බස්රථ දෙකෙන්ම රු. 10,700/- කට වැඩි ආදායමක් ලබා දී ඇත. ඒ අනුව අත්සනින් බල රහිත චෝදනා පත්‍රයේ සඳහන් එක් චෝදනාවක් සාවද්‍ය චෝදනාවක් බැව් හෙළි වේ. බස්රථ අතිරේක ගමන් වාර සඳහා යෙදවීමට බලය ඇති බව සාක්ෂිකරු හෙළි කළේය. ඒ අනුව එසේ බස්රථ දෙකක් අමතර ගමන් සඳහා යෙදවීම විෂමාචාර ක්‍රියාවක් නොවන බව සාක්ෂිකරු හෙළි කළේය.

අදාළ බස්රථවල කොන්දොස්තරවරු හා රියදුරන් වගඋත්තරුවන්ගේ සාක්ෂිකරුවන් ලෙස කැඳවා තිබිණ. ඔවුන්ගේ සාක්ෂි මගින් අදාළ බස්රථ දෙකම සෙනසුරාදා දිනයන්හි ධාවනයට නොයෙදවූ බස්රථ බවත්, එදින ධාවනයෙහි යෙදවීම හේතුවෙන් අමතර ආදායමක් ලැබුණ බවද හෙළි කර ඇත.

තවදුරටත් පරීක්ෂාවෙන් බලනවිට වගඋත්තරකාර පාර්ශවයේ 2010.01.17 දිනැති හේතු දැක්වීමේ පළමු ප්‍රකාශයේ (නඩු ගොනුවේ 10 හා 11 පිටුව) ඉල්ලුම්කරුවන් තිදෙනාගේ පත්වීම් පිළිගෙන ඇත. එහි 02 වන ඡේදය මෙසේය :

"02 මෙම ඉල්ලුම්කරුවන් තිදෙනා සම්බන්ධයෙන් 2006.07.14 වෙනි දිනැති චෝදනා පත්‍ර ඉදිරිපත් කරමින් පහත චෝදනා ගොනු කර ඇත.

(i) 2006.05.20 දින N. A. 1500 හා 62 - 3002 දරන බස්රථ දෙක හොරණ විද්‍යාරත්න පිරිවෙනේ සිට කොබවක දක්වාත්, කොබවක සිට හොරණ දක්වාත්, බුලත්සිංහල සිට හොරණ විද්‍යාරත්න පිරිවෙන දක්වාත්, අමතර ගමන් වාර ධාවනය කිරීමට ඩිපෝ අධිකාරී තැනගේ අවසරයකින් තොරව උපදෙස් දීම,
(ii) දෛනික මාර්ග ලේඛන ආදායම අහිමි කිරීම
(iii) රාජකාරි බලය අයුතු ලෙස යොදා ගැනීම

03. මෙම චෝදනාවන් සම්බන්ධයෙන් මෙම ඉල්ලුම්කරුවන් තිදෙනාම ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාව ප්‍රකාරව iv වගන්තිය යටතේ විනය විභාගයක් පැවැත්වීමට 2006.06.08 දිනැති ලිපිය ප්‍රකාරව 2006.06.10 දින සිට වේතන සහිතව සේවය තහනම් කර ඇත.

04. ඉහත කරුණු අනුව මෙම ඉල්ලුම්කැවන්ගේ සේවය අවසන් කිරීම යුක්තිසහගත හා සාධාරණ බව වගඋත්තරකරු වෙනුවෙන් වැඩිදුරටත් කියා සිටිමි.

එසේ හෙයින් මෙම වගඋත්තරකරු ගරු බේරුම්කරණ අධිකරණයෙන් අයැද සිටින්නේ,

(i) ඉල්ලුම්කරුගේ ඉල්ලුම් පත්‍රය නිෂ්ප්‍රභා කරන ලෙසත්,
(ii) ............................................
(iii) ............................................"

යනාදී ආකාරයෙන් ඉල්ලුම්කරුවන්ගේ යොමුව සම්බන්ධයෙන් වගඋත්තරකරුගේ නීතිඥවරිය හේතු දැක්වීමේ ලිපිය ප්‍රකාරව ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කිරීම යුක්තිසහගත බැව් දක්වතත් එය සාවද්‍ය ප්‍රකාශයක් බව පැහැදිලි වේ. වගඋත්තරකාර පාර්ශවය නොසැලකිල්ලෙන් හා ද්වේශ සහගත ලෙස ඉල්ලුම්කරුවන් හට සැලකීම මෙමඟින් තහවුරු වේ.

වගඋත්තරකරුවන් වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුවන්ගේ ඇතැම් සාක්ෂි මගින්ද පැමිණිල්ල ඔප්පු කිරීමට සහාය ලැබී ඇත. එනම්,

(i) ඉල්ලුම්කරුවන් ආයතනයේ විධායක නිලධාරීන් වූයෙන් එම සාක්ෂිකරුවන් වූ බස්රථවල රියදුරු, කොන්දොස්තර ආදීහු ඔවුන් හට ධාවන උපදෙස් දුන් බව.
(ii) බස්රථ ධාවන සැලැස්ම වෙනස් කිරීමට හා අතිරේක ගමන් වාර ධාවනයෙහි යෙදවීමට ඩිපෝවේ ඉහළ නිලධාරීන්ට (උදා. ඉල්ලුම්කරුවන්ට) බලය තිබූ බව.
(iii) සාක්ෂිකාර කොන්දොස්තරවරයාට උපදෙස් ලිඛිතව මෙන්ම වාචිකව ඩිපෝවේ උසස් නිලධාරීන් දෙන බව.
(iv) "මහජනතාව ගොඩක් ඉන්න කොට වාචිකව කිව්වහම අසවල් ගමන් වාරය යන්න කියල අපට යන්න වෙනව" යනුවෙන් තමන් හට උපදෙස් විවිධ ලෙස ලැබෙන බව.
(v) අදාළ බස්රථ (එනම් N. A. 1500 හා 62 - 3002) සෙනසුරාදා දිනවල ධාවනය නොවූ හෙයින් බස්රථ ධාවනයෙන් විශේෂ ආදායමක් ලැබූ බව.
(vi) ධාවන අංක 25 සෙනසුරාදා දින ධාවනය සඳහා නොයොදන බස් රථයක් බව.
(vii) රියදුරු සමරනායකට ඉන්ධන පුරවන අවස්ථාවේ ඩිපෝ අධිකාරී ගුණෙත්ති මහතා බස්රථය ගෙන ගියේ කොහේදැයි විමසූ විට දානය සඳහා සංඝයා වහන්සේ වැඩමවීමට ගිය

බව ප්‍රකාශ කෙළෙන් එතැනදීද එකී ගමන නිහඬතාවයෙන් අනුමත කළ බව යනාදී කරුණු ඉල්ලුම්කරුවන්ගේ වාසියට හෙළිදරව් කළහ.

මෙකී කරුණු අනුව එනම් :-

(i) ඩිපෝ අධිකාරිවරයා බස්රථ ධාවනයේ යෙදවීම සඳහා ලිඛිත හා වාචික උපදෙස් ලබා දුන් බව
(ii) එසේ අවසරය ලබා නොදුන්නද මෙම ඉල්ලුම්කරුවන් තිදෙනාටම බස්රථ ධාවනයේ යෙදවීම සම්බන්ධ බලය නිළයට අනුව පරිචයේ පැවති බව
(iii) අනතුරක් මඟින් බස්රථයකට හානි සිදු වූයේ මෙම ඉල්ලුම්කරුවන් අතින් නොව අදාළ බස්රථය පැදවූ රියදුරුගේ වරදින් බව
(iv) ඩිපෝ අධිකාරිවරයාගේ ලිඛිත අවසරය තිබුණද, ඔහුගේ අවසරයකින් තොරව බස්රථ ධාවනයෙහි මෙම ඉල්ලුම්කරුවන්ගේ අභිමතය පරිදි යෙදවූ බවට චෝදනා ගොනු කිරීම සාවද්‍ය බව
(v) බරපතල විෂමාචාරයක් ලෙස හඳුන්වනු ලැබූ චෝදනා විනය ව්‍යවස්ථාවට පටහැනි බව
(vi) චෝදනා පත්‍රයට නිසි බලධාරියකු අත්සන් නොයෙදවීමෙන් බල රහිතවීම
(vii) අභියාචනා මණ්ඩලය බල රහිතවීම
(viii) විනය ව්‍යවස්ථාවට පටහැනි දඬුවම් පැමිණවීම ආදී කරුණු මත මෙහි ඉල්ලුම්කරුවන් හට අගතියක් සිදුව ඇති බැව් පැහැදිලි වේ.

වගඋත්තරකාර පාර්ශවය ආර්/01 සිට ආර්/24 "බී" දක්වා ලේඛන උපයෝගී කර ගනිමින් ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත. එහෙත් එනම්,

(i) R/ 15 - සේවය අවසන් කිරීමේ ලිපිය
(ii) R/ 16 - සභාපතිතුමා විසින් ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු වෙත බලය පැවරීමේ ලිපිය.
(iii) R/ 17 - සභාපතිතුමා අමතන ලද හොරණ ඩිපෝ කළමනාකරුගේ ලිපිය යන එකී ලේඛන ගොනුවෙහි නොතිබූ බැවින් ඒවා සැලකිල්ලට ගත නොහැකි විය.

ඉහතින් සඳහන් කළ සියලු කරුණු සැලකිල්ලට ගත් කළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හොරණ ඩිපෝවට අනුයුක්තව සිටි V වන ශ්‍රේණියේ නිලධාරීන් වන එන්. පී. බාලසූරිය, ආර්. ඒ. ඩී. නිහාල්, එච්. ඒ. ජගත්චන්ද්‍ර යන මහත්වරුන්ගේ වැඩ තහනම් කර තිබූ 2006.06.10 සිට 2006.10.10 දක්වා වූ කාල සීමාව සඳහා නොගෙවන ලද අඩ වැටුප් ලබා ගැනීමට හිමිකම් ලබන්නේද යන්නට පිළිතුර "ඔව්" යැයි නිගමනය කරමි. එබැවින් එකී නොගෙවන ලද අඩ වැටුප් ගෙවීමට වගඋත්තරකාර පාර්ශවයට නියෝග කරමි.

කෙබඳු ප්‍රමාණයක මුදලක් ඔවුන් එකිනෙකාට ගෙවිය යුතුද යන්නට පිළිතුර මෙසේය.

2006.06.10 සිට 2006.10.10 දක්වා ඉල්ලුම්කරුවන් තිදෙනාටම නොගෙවන ලද අඩ වැටුපද එකී කාලයට ඔවුන් තිදෙනා හිමිකම් ලැබූ අතුරු දීමනාද. තිදෙනාටම විනය හේතු මත සේවය නතර කර සිටි කාලය තුළ උසස්වීම් ලැබීමට හිමිකම් තිබූ හෙයින් ඊට ඉඩ ලබා දීමද සේවක අර්ථසාධක අරමුදල සඳහා බැර විය යුතු මුදලද, අහිමි වූ වේතන වැඩිවීම් ඇතොත් එයද. අහිමි වූ තනතුරු දීමනාද වෙනත් දීමනාද ඇතුළු සියළුම කරුණු සැලකිල්ලට ගෙන එක් අයකුට රුපියල් 48,000/- බැගින් ඉල්ලුම්කරුවන් තිදෙනාට වෙන වෙනම ගෙවීමද, අපේක්ෂා කරන්නේ නම් ස්ථාන මාරුද, වෛකල්පිත හේතූන් මත විශ්‍රාම ගත්වා ඇති බාලසූරිය මහතාට ලැබිය යුතු යම් වෙනත් දීමනා වෙතොත් එයද, ඉල්ලුම්කරුවන් තිදෙනාහට වෙන් වෙන්ව ගෙවීමට නියෝග කරමි.

යොමුවේ 02 වෙනි කොටසට පිළිතුරු පහත පරිදි වේ.

ඉල්ලුම්කරුවන් තිදෙනා වැඩ තහනමට ලක්ව සිටි කලය තුළදී උසස්වීම් සඳහා අයදුම් කිරීමට තිබූ ඉඩ ප්‍රස්ථා අහිමි වී ඇති බැවින් ඉල්ලුම්කරුවන් එකිනෙකාට වෙන් වෙන්ව ඔවුන් හට අහිමි වූ උසස්වීම් ලබාදීම සඳහා අවශ්‍ය පියවර, පහසුකම් වගඋත්තරකාර පාර්ශවය විසින් ඇති කිරීම කළ යුතු යැයි තවදුරටත් නිගමනය කරමි.

මෙය සාධාරණ සහ යුක්තිසහගත ප්‍රදානයකි.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ බේරුම්කාර,
මණ්ඩලයේ සාමාජික.

2013 ජූනි මස 28 දින දී ය.

09 - 917

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.